දෙපාර්තමේන්තු චක්‍රලේඛ : 5/2016

මගේ අංකය - DAPH/AD 05/02/2016
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.
2016. 11. 20

**<u>ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ 2013. 12. 13 දිනැති නව සේවා ව්‍යවස්ථාවේ 12:6 II හා 12:6 III පරිච්ඡේදයන්ට අනුව නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා</u>**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය සේවයේ IIIපන්තියේ නිලධාරීන් සඳහා පහත පුහුණු අවශ්‍යතා ලබා දිය යුතු බව තීරණය කළ අතර පළාත් අධ්‍යක්ෂවරුන්ගේ ද එකඟතාවය මත මෙම චක්‍රලේඛය ඉදිරිපත් කරමි.

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය සේවයේ III පංතියේ නිලධාරීන් සඳහා

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය සේවයේ III පංතියේ නිලධාරීන් එම සේවයේ II පංතියට සුදුසුකම් ලැබීමට පහත දැක්වෙන පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය. වසර 10ක කාලයක් තුළ එම පුහුණු අවශ්‍යතා අනුව අදාල පුහුණුව ලබා ගත යුතුය. මේ සඳහා පහත දැක්වෙන ආකාරයට අවම වශයෙන් දින 03ක පුහුණු පාඨමාලා 05ක් සම්පූර්ණ කළ යුතුය. ඒ ඒ විෂය ක්ෂේත්‍රය යටතේ පැය 1,2 වැනි පුහුණු පාඨමාලා එකතු කර අවශ්‍ය පැය ගණන සම්පූර්ණ කිරීමට අවකාශ ඇත. පුහුණු පාඨමාලාව අඛණ්ඩ අධ්‍යාපන ආයතනයේදී පැවැත්වෙනු ඇත.

**සේවාස්ථ පුහුණුව, IIIශ්‍රේණිය: (අවු:10)**
පැවැත්වෙන අවම දින සංඛ්‍යාව 15කි

පුහුණු වැඩසටහන් සංඛ්‍යාව : අවම ඒකක 05
පහත දැක්වෙන වැඩසටහන් අනිවාර්යය වේ. (ඒකක 3)

01. සාමාන්‍ය පරිපාලනය හා මූල්‍ය
02. ව්‍යාප්ති හා සන්නිවේදනය
03. රාජ්‍ය ආයතනික කළමනාකරණය

➢ **අනෙකුත් වෛකල්පිත වැඩසටහන් (තෝරා ගත් ඒකකයකින් 2 ක්)**

❖ වැඩිදියුණු කිරීම සඳහා පහත සඳහන් ක්ෂේත්‍ර * ඒකක/මොඩියුල හඳුනාගෙන ඇත.

01. සත්ත්ව සෞඛ්‍ය
02. සත්ත්ව අභිජනන
03. ආහාර හා කළමනාකරණය
04. පශු මහජන සෞඛ්‍යය හා සත්ත්ව විද්‍යාව
05. ව්‍යාපෘති කළමනාකරණය
06. පශු අණපනත් කටයුතු
07. ආහාර ආරක්ෂණය
08. පශු ආර්ථික හා සංඛ්‍යා ලේඛනය

(*- යම් විශේෂ ක්ෂේත්‍රයක් යටතේ පැවැත්වෙන පූර්ණ, තෙදින වැඩසටහනක් තුළ පාඨමාලා එකක්,දෙකක් හෝ තුනක වැඩසටහනක් ඇතුළත් වේ.)

## ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය සේවයේ II පංතියේ නිලධාරීන් සඳහා

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II පංතියේ නිලධාරීන් එම සේවයේ I පංතියට සුදුසුකම් ලැබීමට පහත දැක්වෙන පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය

- වසර හතක කාලයක් තුල එම පුහුණු අවශ්‍යතා අනුව අදාල පුහුණු ලබා ගත යුතුය. මේ සඳහා පහත දැක්වෙන ආකාරයට අවම වශයෙන් දින 02ක පුහුණු පාඨමාලා 05ක් සම්පූර්ණ කළ යුතුවේ.
- ඒ ඒ විෂය ක්ෂේත්‍රය යටතේ පැය 1,2 වැනි පුහුණු පාඨමාලා එකතු කර අවශ්‍ය පැය ගණන සම්පූර්ණ කිරීමට අවකාශ ඇත. පුහුණු පාඨමාලාව අඛණ්ඩ අධ්‍යාපන ආයතනයේදී පැවැත්වෙනු ඇත.

**සේවාස්ථ පුහුණුව II ශ්‍රේණිය (අවු: 07)**
පැවැත්වෙන අවම දින ගණන 10කි.
පුහුණු වැඩසටහන් සංඛ්‍යාව : අවම ඒකක 05

**පහත ක්ෂේත්‍ර පිළිබඳ වැඩිදුර පුහුණුව**

- වැඩිදියුණු කිරීම සඳහා පහත සඳහන් ක්ෂේත්‍ර * ඒකක/මොඩියුල හඳුනාගෙන ඇත.

01. සත්ත්ව සෞඛ්‍ය
02. සත්ත්ව අභිජනන
03. ආහාර හා කළමනාකරණය
04. පශු මහජන සෞඛ්‍යය හා සත්ත්ව විද්‍යාව
05. ව්‍යාපෘති කළමනාකරණය
06. පශු අණපනත් කටයුතු
07. ආහාර ආරක්ෂණය
08. පශු ආර්ථික හා සංඛ්‍යා ලේඛනය

(*- යම් විශේෂ ක්ෂේත්‍රයක් යටතේ පැවැත්වෙන පූර්ණ, තෙදින වැඩසටහනක් තුළ පාඨමාලා එකක්,දෙකක් හෝ තුනක වැඩසටහනක් ඇතුළත් වේ.)

## ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය සේවයේ I පංතියේ නිලධාරීන් සඳහා

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය සේවයේ I පංතියේ නිලධාරීන් එම සේවයේ විශේෂ ශ්‍රේණියට සුදුසුකම් ලැබීමට පහත දැක්වෙන පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය.

- වසර පහක කාලයක් තුල එම පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කර ගත යුතුවේ.

**සේවාස්ථ පුහුණුව, I ශ්‍රේණිය (අවුරුදු 05)**

පැවැත්වෙන පුහුණු වැඩසටහන් සංඛ්‍යාව - අවම දින සංඛ්‍යාව 05 කි.

*කළමනාකරණය පිළිබඳ උසස් පාඨමාලා

(*- කළමනාකරණ මූලධර්ම, කළමනාකරණ කාර්යයන්, කළමනාකරණ පරිසරය, සහභාගිත්වය කළමනාකරණය, මහජන සබඳතා, සන්නිවේදන කුසලතා, යහපාලන, ආචාරධර්ම)

අන්තර් කාලය තුළදී ඊළඟ උසස්වීමට අදාල වසර ගණන සම්පූර්ණ කර ඇත්නම් ඉහත පුහුණු වීම අදාල නොවේ. සම්පත් දායකයින් පිටතින්ද ලබා ගන්නා අතර, පුහුණු පාඨමාලා සියල්ල සංවිධානය කර පවත්වනු ලබන්නේ අඛණ්ඩ අධ්‍යාපන ආයතනය මඟිනි.

මීට පෙර තම තමන් සහභාගි වූ පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය සනාථ කළ හැකි නම් ඉහත සඳහන් අදාල පුහුණු පාඨමාලාවලට සහභාගි වූවා සේ තීරණය කිරීමේ බලය අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

සියලු පාඨමාලා අවසානයේදී අඛණ්ඩ අධ්‍යාපන ආයතනය මඟින් සහතිකයක් ලබා දිය යුතුය.

වෛද්‍ය ඩී.ඒ.සී. තිස්කුමාර
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්